**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**
**2 වැනි වගන්තිය සහ 5 වැනි වගන්තිය යටතේ නියමය**

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 10.05 | 1005.90 | අනෙකුත් - බඩ ඉරිඟු | කි. ග්‍රෑමයට රු. 10/- |
| 2 | 10.07 | 1007.90 | අනෙකුත් - ඉදල් ඉරිඟු (සෝගම්) | කි. ග්‍රෑමයට රු. 10/- |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත උපලේඛනය මගින් දක්වා ඇති බඩ ඉරිඟු ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 10 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන, ඉතිරි වටිනාකම, ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා , ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය වෙත පමණක් අත්හරිනු ලැබිය යුතු බවට මම මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය 2022 ......මාර්තු...... මස ......04...... දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ 2021 මැයි මස 17 දිනැති අංක 2228/3 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් බඩ ඉරිඟු (රේගු සංකේත අංක 1005.90), සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්ති යටතේ පනවන ලද 2021 දෙසැම්බර් මස 21 දිනැති අංක 2259/9 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාශිත නියමය 2022 ......මාර්තු...... මස ......04......වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**බැසිල් රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2022 ......මාර්තු...... මස ......03...... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය

# Government Notification

## Special Commodity Levy Act, No. 48 of 2007

## Order under Section 2 and Section 5

1. By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Basil Rajapaksa, Minister of Finance of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodities specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

**SCHEDULE**

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1 | 10.05 | 1005.90 | Other – Maize | Rs. 10 per kg |
| 2 | 10.07 | 1007.90 | Other- Grain Sorghum | Rs. 10 per kg |

2. By virtue of the powers vested in me by Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, I do hereby make an order to waive-off balance amount after collecting Rs1 per kg from the applicable Special Commodity Levy of Rs.10 per Kg on importation of Maize, listed out in the Schedule of the above, for production of "Thriposha" by Sri Lanka Thriposha Limited.

3. This Order shall be valid for a period of 6 months commencing from March 04, 2022 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

4. The Order made under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2228/3 of May 17, 2021 in respect of Maize (HS Codes 1005.90) and the Order made under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2259/9 of December 21, 2021 are rescinded with effect from March 04, 2022

**Basil Rajapaksa**
**Minister of Finance**

Ministry of Finance
Colombo 01,
March 03, 2022.